**සී/ස ලංකා නැව් සංස්ථාව**
**(වරාය, නාවික කටයුතු හා ගුවන් සේවා අමාත්‍යාංශය)**

# ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා පුරප්පාඩු පිරවීමට අදාළ සුදුසුකම් හා පළපුරුද්ද ඇති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසිභාවය දරන සුදුසු ඉල්ලුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**<u>අභ්‍යන්තර විගණක තනතුර -MM 1-1, Gr. II ( ඇබෑර්තු 01 කි)</u>**

.

**බාහිර අපේක්ෂකයින්:**

**<u>අධ්‍යාපන සුදුසුකම්</u>:**

විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් විශ්ව විද්‍යාලයක මූල්‍ය, ගිණුම්කරණය, වාණිජ්‍ය පිළිබඳ උපාධිය

**හෝ**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරණ ආයතනයේ (ICASL) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම (Intermediate level qualification)

**හෝ**

කළමනාකරණ ගණකාධිකාරිවරුන්ගේ වරලත් ආයතනයේ (CIMA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම (Intermediate level qualification)

**හෝ**

වරලත් සහතිකලත් ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (ACCA) අන්තර් මධ්‍ය මට්ටමේ සුදුසුකම (Intermediate level qualification)

**හෝ**

ගණකාධිකරණය පිළිබඳ උසස් ඩිප්ලෝමාව (HNDA in Accountancy) - ශ්‍රී ලංකා උසස් තාක්ෂණික අධ්‍යාපන ආයතනය(SLIATE)

**සහ**

ඉහත සුදුසුකම් ලබාගැනීමෙන් පසුව ගිණුම්කරණය, මූල්‍ය ක්ෂේත්‍රය තුළ රජයේ දෙපාර්තුමේන්තුවක / සංස්ථාවක / මණ්ඩලයක හෝ පිළිගත් වෙළෙඳ ආයතනයක කළමනාකරණ තනතුරක (MM කාණ්ඩය) අවම වශයෙන් එක් (01) වසරක සේවය.

**අභ්‍යන්තර අපේක්ෂකයින්:**

**<u>අධ්‍යාපන සුදුසුකම්</u>:**

1. ඉහත බාහිර අපේක්ෂකයින්ට අදාළ වන්නා වූ සුදුසුකම්

**හෝ**

2.විෂය ක්ෂේත්‍රයට අදාලව කණිෂ්ඨ කළමනාකරු (JM 1-2) කාණ්ඩයේ අවම වශයෙන් පස් (05) වසරක සතුටුදායක සේවය

**වැටුප් පරිමාණය :**

MM 1-1 – 2016 : රු. (53,175 -10 ×1375 -15× 1,910-95,575) සංශෝධිත වැටුප අනුව, 2020/01/01 දිනට MM 1-1 කාණ්ඩයේ II ශ්‍රේණියේ මූලික වැටුප රු. 53,175/- ක් වේ.

ඉහත වැටුපට අමතරව රජයට අයත් ව්‍යවසායන් සඳහා අනුමත අනෙකුත් අදාල දීමනා ගෙවනු ලැබේ.

**වයස් සීමාව: -** වයස අවුරුදු 18 ට නොඅඩු හා අවුරුදු 45 ට නොවැඩි විය යුතුය. උපරිම වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින්ට අදාළ නොවේ.

**බඳවාගැනීමේ ක්‍රමවේදය :** ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින්
**පරිවාස කාලය :** බාහිර අයදුම්කරුවන් සඳහා අවුරුදු 03ක් අභ්‍යන්තර අයදුම්කරවන් සඳහා වසර 1 කි.

**ප්‍රතිලාභ**

1. සේ.අ.අ. / සේ.නි.භා.අරමුදලට සංස්ථාවේ දායකත්වය
2. නේවාසික හා බාහිර ප්‍රතිකාර සඳහා ශල්‍යකර්ම හා රෝහල්ගත කිරීම් සඳහා රක්ෂණ ආවරණය
3. සම්පූර්ණ පුද්ගල සහ අනතුරු රක්ෂණ ආවරණය
4. භාවිතා නොකල වෛද්‍ය නිවාඩු වලට ගෙවීම්
5. වාර්ෂික ප්‍රසාද දීමනා අදාල පරිදි
6. සහනශීලී නියමයන් මත නිවාස ණය සහ සේවක මණ්ඩල ණය
7. සහනශීලී පොලී අනුපාත මත වාහන ණය

## පොදු උපදෙස්

සියලුම අයදුම්පත් සමඟ අධ්‍යාපන / වෘත්තීය සුදුසුකම් සනාථ කෙරෙන සහතිකවල පිටපත් තමා විසින්ම සහතික කොට උප්පැන්න සහතිකය හා අනෙකුත් සහතිකවල පිටපත් සහ තමන් පිළිබඳ විමසිය හැකි ඥාතීන් නොවන දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්ද සහිතව **ලියාපදිංචි තැපැලෙන් මෙම දැන්වීම පළවූ දින සිට දින 10ක් ඇතුළත හෝ ඊට ප්‍රථම සභාපති, නො.27, MICH ගොඩනැගිල්ල, ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය) , කොළඹ 01** ලිපිනයට ඉදිරිපත් කළ යුතුය.

- අයදුම්පත එවන ලිපි කවරයේ වම්පස ඉහල කෙළවරෙහි අයදුම් කරනු ලබන තනතුර සඳහන් කර තිබිය යුතුය.
- රාජ්‍ය අංශයේ ආයතනවල සේවකයින්ගේ අයදුම්පත් අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මගින් ඉදිරිපත් කළ යුතුය.
- ප්‍රමාද වී ලැබෙන සහ අසම්පූර්ණ අයදුම්පත් පිළිබඳ සලකා බලනු නොලැබේ.
- පත්කිරීම් බලධාරියා විසින් පත් කරන ලද මණ්ඩලයක් විසින් පවත්වන ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක දී අයදුම්කරුවන් ඇගයීමට ලක් කරන බව කරුණාවෙන් සලකන්න.

**ඉහත අවශ්‍යතාවන්ට අනුකූල නොවීම අයදුම්පත ප්‍රතික්ෂේප වීමකට හේතු විය හැකිය. යම් ආකාරයක බලපෑම් කිරීම නුසුදුසුකමක් වනු ඇත.**

**සභාපති**
**සීමාසහිත ලංකා නැව් සංස්ථාව**
**අංක 27, MICH ගොඩනැගිල්ල**
**ශ්‍රීමත් රසීක් ෆරීඩ් මාවත (බ්‍රිස්ටල් වීදිය)**
**කොළඹ 01**

වැඩි විස්තර සඳහා- 011 239 4624, 202 දිගුව, නීති/රක්ෂණ හා මානව සම්පත් අංශය
දිනය : 04.04.2023